# සියදිවි නසා ගැනීම පිළිබඳ නෛතිකමය සහ සමාජවිද්‍යාත්මක ඇසින්


## අචල තාරක*


ජීවිතය යනු කුමක්දැයි මා එක නිමේෂයක ඔබෙන් ප්‍රශ්නයක් අසමි. එවිට ඔබද ,මමද ජීවිතය යනු කුමක්දැයි නිර්වචනය කරන ආකාරය එකිනෙක වෙනස් වන්නට පුළුවන. නූතන විද්‍යාත්මකව , ආගම මත පදනම්ව, සමාජවිද්‍යාව මුලාශ්‍ර කොට ගෙන ජීවිතය යනු කුමක්දැයි ඔබ පසිදලන්නට පුළුවන . ලොව ඇති අපූර්වතම ත්‍යාගය නැතහොත් දෙවියන් විසින් හෝ දෙමාපියන් විසින් දුන් අපූර්වතම තිළිණය ජීවිතය යයි මා මෙහි ලියමි. ඒ මට දැනෙන, මට හැඟෙන බොලද වුද සිත කියන්නා වූද ජීවිතය යන්නට මට දිය හැකි හොඳම පිළිතුරයි. උපදින විට තිළිණවන , පළමු වැරදීමතුල , පළමු පියවර තැබීම මත, පළමු ආදරය අතුරින් , පළමු හාදුව අබියසින් , ජයගන්නා හැම විටකමද , පැරදී නැගී සිටින හැම විටකදීම, සිතට මෙන්ම ආත්මයටම දැනුන යම් දෙයක් වේ නම් එය ජීවිතය බව යූටියුබ් වීඩියෝවක් මෙය ලියන තප්පරයේ මට පවසමින් සිටියි. සැබවින්ම ජීවිතය යනු අර්ථකථනය කල නොහැකි අපූර්වතම දායාදයකි.

තප්පරයෙන් තප්පරය විඳිනා, විඳවනා ජීවිතය එක නිමේශයකදී අවසන් කොට, ජීවිතය තුලින් නික්ම යාමට යමකුට සිතෙන්නේ නම් එය සැබවින්ම පුදුම සහගතය. ලොව වෙසෙනා සෑම සත්වයෙකුම පාහේ වඩා ආදරය වන්නේ තම ජීවිතයට බව බොහෝ ආගමික නායකයින් දේශනා කොට ඇති බව සැබෑය. නමුත් සිය දිවිය අත් හරින්නට සිතනා මිනිසුන් වෙසෙන සමාජයන් අප අතරම තිබෙන බව කෙනෙකු පිලි නොගන්නට හැකිය . බොහෝ සිය දිවි නසා ගැනීම් වාර්තා වන රටක් තුල අප වාසය කරමු. එය ලෝකය පළමු ස්ථානය බව ලෝක සෞඛ්‍යය සංවිදානය නිවේදනය කලේ 2017 වර්ෂය ආරම්බයේදීය. රටවල් එකසිය හැත්තෑ දෙකක් අතුරින් ශ්‍රේණිගත කල සියදිවි නසා ගැනීමේ දත්තයන් අනුව ශ්‍රී ලංකාව තුල පිරිමි පාර්ශවයට වඩා කාන්තාවන් සිය දිවි නසා ගැනීමට පෙලඹෙන බව වාර්තා වී තිබේ. එය එකට නවයක අනුපාතයකි. ලොව සිය දිවි නසා ගැනීම වැඩිම රටක් ලෙස පෙර වසරවල් තුලදී වාර්තා වූ ශ්‍රීලංකාව තුල මිනිසුන් එසේ තම දිවිය අවසන් කිරීමට පෙලඹෙන හේතුව විමසා බැලීම ඔබේද මගේද ප්‍රබල යුතුකම වන්නේය. සියදිවි නසා ගැනීමට ශ්‍රීලංකාව වැනි රටක් තුලින් වාර්තා වන්නාවූ හේතු සාධක ලෙස ජීවිතය පිළිබඳ බලාපොරොත්තු සුන් වීම, මානසික ආතතිය , හිනොන්මාදය , ආර්ථික දුෂ්කරතා මෙන්ම හුදෙකලාවීම දැක්විය හැකිය.

සිය දිවි නසා ගැනීම පිළිබඳව අදහස් ඉස්මතුව ඇත්තේ පුළුල් තේමාවන් වන ආගම දර්ශනය ගෞරවය සහ ජීවිතයේ අර්ථය මතය. ගින්නෙන් දැවී අළුවී යාම මත සිය ආත්මය පවිත්‍ර වන බව විස්වාස කල උතුරේ ක්‍රියාත්මක වූ දෙමළ ඊලාම් විමුක්ති කොටි සංවිදානයේ කාන්තාවන් මරාගෙන මැරෙන කොටි සාමාජිකාවන් බවට පත් වුහ. සිය සැමියා කෙරෙහි උපන් අසීමිත සෙනෙහස නිසා හෝ සමාජ සම්මතයන් නිසා හෝ ඉන්දියානු පතිනියන් සිය සැමියාගේ චිතකයේ හිඳ ඔහුගේ ප්‍රාණය නිරුද්ධ සිරුර සමග සිය දිවියද ගිනි දෙවියන්ට පිදුහ. එක්දහස් නවසිය හැත්තෑ අටේදී ගානාවේ ජෝන්ස් ටවුන් නගරයේ පීපල්ස් දේවස්ථානය තුල ජිම් ජෝන්ස් නම් පූජකවරයා විසින් දරුවන් සහ කාන්තාවන් ඇතුළු නවසිය දහඅට දෙනෙකු සිය දිවි නසා ගැනීමට පෙලඹවූ අතර ඉන් තුනෙන් එකක් පමණ සයනයිඩ් විෂ මිෂ මරණයක් වුහ. ජපානයේ ඔකිගහරා වනාන්තරය ලොව පුරා ප්‍රසිද්දියට පත්ව ඇත්තේ ෆුජියාමා කන්ද පාමුල හරිත සාගරය නම් වනාන්තරය නිසා නොව පුරාණයේ සිට සිය දිවි නසා ගන්නන් හා දිවිය අත් හැර යන්නන් සිය අවසන් ගමන උදෙසා ඔකිගහරාව තෝරා ගත් නිසාය. රුස්ස ගසක ගෙල වැලලාගෙන , විස භාවිතයෙන් හෝ ඖෂධ අධිමාත්‍රාවන් භාවිතයෙන් හෝ කන්දෙන් බිමට පැනීම මගින් ජපනුන් සිය දිවිය ඔකිගහරාවේදී නසා ගත්හ. වර්තමානයේ පවා ඔකිගහරාව තුලත් සමස්ත ජපානය තුලත් සිය දිවි නසා නසා ගැනීමේ අනුපාතය ඉතාම ඉහලය. චීනයේ ෆොක්ස් කොන් ආයතනය සිය ආයතන පරිශ්‍රය සමන්විත


* දෙවන වසර, ශ්‍රී ලංකා නීති විද්‍යාලය



MANURAWA 2020



©All rights reserved


ISSN 1800-055X Vol. Iv

ගොඩනැගිල්ල වටා දැල් සවි කිරීමට තීරණය කලේ දෙදහස් දහහත වසරේදීය. දෙදහස් දහසේ සිට මේ දක්වා ඉහල මහල් වල සිට බිමට පැන සිය දිවි නසා ගත් සේවකයින් ගණන වසරකට අටසියයකි. පැය ගණනක් විවේකයකින් තොරව සේවය කිරීමට සිදු වීම, පැයකය යෙන් සත තිස්පහක වූ අසාධාරණ ගෙවීම, දරදඬු පාලනයන්, සීමා කිරීම් මෙන්ම මානව හිමිකම් දැවැන්ත ලෙස සීමා කර තිබීම මෙම මරණ වලට හේතුව ලෙස ඇපල් සමාගම කල පර්යේෂණයකින් අනාවරණය විය. එම ආයතනය තුල සේවය කරන්නන් ටැබ් පරිගණක එකලස් කලද කිසිදිනක ටැබ් යන්ත්‍රයක් ක්‍රියාත්මක වීම දැක නොතිබිණ. ඇමරිකාවේ ජීවත්වූ බොබී නම් තරුණයකු වටා ගෙතුණු "ප්රේයර් ෆොර් බොබී " චිත්‍රපටය එළි දකින්නේ දෙදහස් අට වසරේදීය. තම සමරිසිභාවය මව විසින් පිලි ගැනීම ප්‍රතික්ෂේප කොට දිගින් දිගටම ආගමානුකුල වත් පිළිවෙත් හරහා සිය පුතු සුව කිරීමට යාමේ ප්‍රතිපලයක් ලෙස ඖෂධ අධිමත්රාවක් ගෙන බොබී විසින් සිය දිවි තොර කර ගැනීමට උත්සහ කරන අතර තේරීමක් කල නොහැකි උරුමයක් වූ සමරිසි භාවය හා එයට එල්ලවන සමාජ පීඩනය හමුවේ බොබී විසින් වේගයෙන් ඇදෙනා ට්‍රක්රථ පෙළක් මතට පාලමක් උඩ සිට පැනීමෙන් සිය දිවි නසා ගනී. එක්දහස් නවසිය හැට දෙකේදී ප්‍රාණය නිරුද්ධ මර්ලින් මොන්රෝ නම් නිළියගේ සිරුර සොයා ගන්නේ සිය ලොස් ඇන්ජලිස් නගරයේ පිහිටි නිවාසය තුල තිබියදිය. සිය කාර්යය බහුල ජීවිතය ඇය විසින් ඖෂධ අධිමත්රාවක් මගින් අවසන් කොට තිබිණි. ඇය එවකට හොලිවුඩ් සිනමා සරාගයේ නිත්‍ය සලකුණ බවට පත්ව තිබුණි. ශ්‍රීලංකා ජාතික ගීය නිර්මාණය කල ආනන්ද සමරකෝන් මහතා සිය ජීවිතය අවසන් කර ගන්නේද ඖෂධ අධිමත්රාවක් සමගිනි.

ශ්‍රීලංකාව සිය දිවි නසා ගැනීම පිලිබඳව පුළුල් කතිකාවතකට නැවතත් සමාජය යොමු වුයේ පසු ගිය කාල වකවානුව තුල වාර්තා වූ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීට ශිෂ්‍යාවකගේ මරණයත් සමගය. කිසිවකු නොදත් ඇයගේ පෞද්ගලික කාරණයක් මගින් රත්වූ යකඩ යකාට බිලිවීමට ඇයට බල කර තිබුණි. බදුල්ල වෙත ඇදී ගිය පොඩි මැණිකේ දුම්රියට ඇය සිය ගෙල තබන්නේ එබැවිනි. ඊට බොහෝ කාලයකට පෙර විශ්වවිද්‍යාලයේ නවක වදය දරාගත නොහැකිව සිසුවකු විසින් නේවාසිකාගාරය පිටුපස ලඳු කැලෑවක් තුල ගෙල වැලලාගෙන මිය ගියේය. දුම්රියට බිලි වූ ශිෂ්‍යාවගේ මරණයත් සමග රට පුරාවටම එවැනි සිදුවීම් රාශියක් වාර්තා වන්නට වූ අතර මහරගම ප්‍රදේශයේ තරුණියක් සහ තරුණයෙක් දුම්රියට බිලි වන්නේ පසු ගිය වසරේදීය. දෙදහස් දහඅට වසරේදී සැබෑ ප්‍රේමයේ නාමයෙන් එකිනෙකා වැලඳගත් යෝගරාජා සහ සකුන්තලා දියළුම ඇල්ලේ සිට පහලට පැනීමෙන් දිවි තොර කර ගත්හ. ඔවුන්ගේ නිසල සිරුරු සොයා ගත්තේ දින දෙකකට පසුවය. සබරගමුව විශ්වවිද්‍යාලයේ නවක වදය දරා ගත නොහැකිව අමාලි චතුරිකා නම් ශිෂ්‍යාවක් ගෙල වැලලා ගෙන මිය ගියේ ඊට ටික කාලෙකට පෙරය.

සියදිවි නසා ගැනීම කුමක්ද යන්න විමර්ශනය කිරීමේදී සිංහල සහ ඉංග්‍රීසි ශබ්දකෝෂයන් මගින් දක්වා ඇත්තේ මෙම ක්‍රියාව මගින් තමන් වෙත මරණය සිදු විය හැක බව දන්නා වූ අවබෝධය සහිත වූ යම් උපක්‍රමයක් මගින් ජීවිතය අවසන් කර ගැනීමේ ක්‍රියාවලියයි. සරලව දක්වන කල්හි සිය දිවි නසා ගැනීම මානවයා ආරම්භයේ පටන් පැවති සමාජ සංසිද්දියක් බව දක්වා තිබේ. මිනිසා වානර යුගයේ සිට වර්තමානය දක්වා මෙහි පැතිරීම පිලිබඳව විමර්ශනය් කිරීමේදී අනුකරණය සහ සමාජ සම්මතය හෝ සිරිත් ලෙස වර්ධනය වන්නට ඇතැයි සිතිය හැකිය. මානව ශිෂ්ටාචාරයේ ගෝත්‍රික අවදියේ සිට වර්තමානය දක්වා භුගෝලිය විවිධත්වයක් සහ විෂමතාවය අනුව සියදිවි නසා ගැනීම පවතී බව එඩ්වඩ් වෙස්ට්මාක් නම් මානව විද්‍යාඥයා විසින් දක්වා තිබේ. ක්‍රිස්තු වර්ෂ හතරවන සහ පස්වන සියවස්තුල ග්‍රීක සහ රෝම ජාතිකයින් තුල පෞර්ෂය,වේදනාව දරාගත නොහැකි බව හෝ දේශානුරාගය ඔස්සේ සියදිවි නසා ගැනීමට පෙලඹවීමක් පැවතී බව ඉතිහාසය ගෙන හැර දක්වයි. රෝමයේ මේ සදහා අවකාශය ලැබුනද පසුකාලීනව 14 වන ලුවී රජු වැනි පාලකයින් විසින් මෙවැනි පුද්ගලයින්ට එරෙහිව දඬුවම් වැඩි කල අතර 19 වන සියවසේදී එක්සත් රාජධානිය විසින් සියදිවි නසා ගැනීමට වෙර දැරීම සහ මනුෂ්‍ය ඝාතනයට තැත් කිරීම එක හා සමාන වරදවල් බව ප්‍රකාශයට පත් කර

MANURAWA 2020

©All rights reserved
ISSN 1800-055X Vol. Iv

තිබුණි. යුයිට් නම් එස්කිමෝ වරුන් අතර සියදිවි නසා ගැනීම සමාජමය සම්මතයක් ලෙස පැවති බව සදහන් වේ. තවද හවායි ජනපදවාසීන් විසින් සිය රජු මිය ගිය විට ඔහුගේ නිලධාරින් සියදිවි නසා ගත බව ජනප්‍රවාද තුල සදහන් කර තිබේ. මිට ඉහත මා විසින් සදහන් කල සති පුජාව නම් දිවි නසා ගැනීමේ ක්‍රියාවලිය තුලදී 1818 වර්ෂය තුල කාන්තාවන් 839 ක් සැමියාගේ චිතකයට බිලි වී ඇති අතර 1821 වර්ෂය වන විට කාන්තාවන් 2336 ක් සැමියා කෙරෙහි උපන් ප්‍රේමය පෙන්වීම සදහා ඔහුගේම චිතකයේ අවසන් සුසුම් හෙලා තිබේ. දෙවන ලෝක යුද්ධ සමයේ හරාකිරි සහ සේප්පුකි යන නාමයන්ගෙන් ක්‍රියාත්මක වූ ජපාන සියදිවි නසා ගැනීම් ජපාන හමුදා තුල ක්‍රියාත්මක වූ අතර දෙවන ලෝක යුද්ධයේදී ජපාන අධිරාජයා විසින් තමා යටත් වන බව ප්‍රකාශ කල නිවේදනය නිකුත් කල මොහොතේදී බොහෝ පිරිස් දරාගත නොහැකි ජාතිකානුරාගය හේතුවෙන් ජපාන රජ මාලිගය ඉදිරිපිට දිවි නසාගත් බවට වන වාර්තා පවතී.

## ආගමික මතවාද සහ සිය දිවි නසා ගැනීම.

ප්‍රංශ සමාජ විද්‍යාඥයකු වන එමිල් ඩුර්කයිම් විසින් සරල සමාජය, යාන්ත්‍රික එකාබද්ධ භාවයකින් යුක්ත සමාජයක් ලෙස හදුන්වයි. ස්වභාවික ලෝකය හා සමීප සබධතා ඇති එකාබද්ධතාවක් ලෙස ඩුර්කයිම් විසින් යාන්ත්‍රික ඒකාබද්ධතාවය හදුන්වා දී ඇත. යාන්ත්‍රික එකාබද්ධතා සහිත සමාජයිය පුද්ගල සබදතා ගොඩනැගී ඇත්තේ ආයාසයෙන් නොව නිරායාසයෙනි. ප්‍රාථමික සමාජ වල යාන්ත්‍රික ඒකාබද්ධතා ලක්ෂණ දැකිය හැකි අතර පුද්ගල විෂමතා අවම වී තිබුණි. ප්‍රධාන වශයෙන් ඒ වන විට පවතින ජනගහනය අවම වීම බලපාන්නට ඇත. පැවති ප්‍රාථමික සමාජයන් නුතන සමාජයන් වෙත පරිනාමය එමිල් දුර්කයිම් විසින් හදුන්වාදී ඇත්තේ යාන්ත්‍රික එකාබද්ධතාවයේ සිට කේන්ද්‍රීය එකාබද්ධතාවය කරා යොමුවීමක් ලෙසයි. ප්‍රථමික සමාජය තුල මිනිස් අවශ්‍යතා සරල වූ අතර නුතන සමාජය මිනිස් අවශ්‍යතා පුළුල් හා සංකීර්ණ තත්ත්වයක පවතී. මුලික අවශ්‍යතා සපයා ගැනීමෙන් අනතුරුව ඔවුන්ට වෙනත් වුවමනා තෘප්ත කර ගැනීමේ අවශ්‍යතාවක් ඇත.

ආගමික පසුබිම පිලිබදව කතිකා කිරීමේදී බුදු දහම සියදිවි නසා ගැනීම පාපයක් ලෙසත් මතු භාවය දුගතිගාමී වීමට එය හේතුවක් වන බවත් දක්වන අතර කතෝලික ආගමද සියදිවි නසා ගැනීම පාපයක් ලෙස දක්වයි. එමෙන්ම යුදෙව් ආගම විසින් එය දෙවියන්ගේ පාරිශුද්ධත්වය පිලි නොගන්නා පුද්ගලයින් විසින් සිදු කරනු ලබන ක්‍රියාවක් බව සදහන් කර ඇති අතර ඉස්ලාම් ආගම විසින් සියදිවි නසා ගැනීම තහනම් කර ඇති බව සදහන්. තවද හින්දු ආගම ගෙනහැර දක්වන ලබන ආකාරයට උපවාස කිරීම මගින් තම ජිවිතය අවසන් කර ගැනීම සදහා යමෙකුට හැකියාවක් පවතින බව දක්වනු ලබනවා. ඉහත දැක්වූ පරිදි හින්දු ආගම විසින් සති පුජාව අනුමත කර තිබේ .භගවත් ගීතාව නම් ග්‍රන්ථයේ අටවැනි පරිජේදයේ 22 සහ 23 යන වගන්ති තුල වසරේ තෝරා ගත් දිනකදී තෝරාගත් ක්‍රමවේදයක් යටතේ තෝරාගත් වෙලාවක මෙලොවෙන් සමුගැනීම යහපත් බව දක්වා තිබේ . එමෙන්ම ඉස්ලාම් ආගම තුලින් බිහිවූ ඇතැම් අන්තවාදී ආගමික කල්ලි ආශ්‍රයෙන් පැනනැගුනු වහාබ්වාදය වැනි අංශ තුල වෙනත් පුද්ගලයින් ඝාතනය තුල ස්වර්ගයේ ද්වාර විවර වන බවට වූ ප්‍රචාරයන් මත එවන් ත්‍රස්තවාදී කණ්ඩායම් මරාගෙන මැරෙන බෝම්බකරුවන් ලෙස ක්‍රියා කරන අතර මෑතක ශ්‍රීලංකාව මුහුණදුන් පාස්කු ප්‍රහාරය වැනි ප්‍රහාර එහි ප්‍රතිපලයකි. ගින්න මත සිය ආත්ම පවිත්‍රතාවය ලබා ගත හැකි බව විශ්වාස කරනු ලබන හින්දු පතිනියන් අපට හමු වන අතර සුප්‍රකට පද්මාවත් චිත්‍රපටයේ දක්වන ආකාරයට මෙන්ම අතීතයේ ඉන්දියානු රාජ්පුත් කාන්තාවන් සිය සැමියාගේ මරණය අවසානයේ හෝ යුධ පරාජයක් අවසානයේ ශුද්ධ වූ ගින්න වෙත සිය සිරුර ලබාදුන් අතර ලංකාව තුල ක්‍රියාත්මක වූ දෙමල ඊලාම් කොටි සන්විධානයේ කාන්තාවන් මරාගෙන මැරෙන බෝම්බ කාරියන් බවට පත්වීමේ එක් හේතුවක් වුයේ ඔවුන් තුල ගින්නෙන් වන ආත්ම පවිත්‍රතාවය පිලිබදව වූ විශ්වාසය යැයි සැලකේ. එමිල් ඩුර්කයිම් නම් ප්‍රංශ මානව විසින් දක්වා ඇති පරිදි පුද්ගල සියදිවි නසා ගැනීම ආකාර ත්‍රිත්වයක් යටතේ දක්වා ඇත. එහි පළමුවැන්න ආත්මීය සියදිවි නසා

MANUPAWA 2020

©All rights reserved
ISSN 1800-055X Vol. Iv

ගැනීමයි. එමෙන්ම පරහිතකාමී දිවි නසා ගැනීමක් තවත් ආකාරයක් ලෙසද ඔහුගේ විග්‍රහය තුල දක්වන අතර බෞද්ධ සාහිත්‍ය තුලද පරහිතකාමී දිවි නසා ගැනීම් බොහොමයක් දක්නට ලැබේ. පන්සීය පනස් ජාතක කතාවන් තුලද බෞද්ධ ඉතිහාසය හා බැඳී බොහෝ ජනප්‍රවාද තුලද මෙලෙස සිය දිවිය තොර කර ගැනීම පිලිබඳව දක්වා තිබේ. තවද දුර්කයිම විසින් දක්වන පරිදි සමාජමය තරගකාරිත්වය තුල ඇතිවන අනෙක විද පිඩාවන් හමුවේ මෙසේ සියදිවිය තොර කර ගැනීමට මිනිසුන් පෙලබෙන බවයි. බුදු දහම උගන්වන පරිදි මිනිසත්බවක් ලැබීම දුර්ලබය එය පරම දුර්ලබ සාධකයකි.

( කිච්ඡෝ මනුස්ස පටිලාභෝ) ලෙස දක්වා ඇත. මිනිසත්බව නසා ගැනීම මෙන්ම ඒ සඳහා අනුබල දීමද බුදු දහමේ අනුමත නොකෙරේ. ඉස්ලාමය පිලිබඳව පුළුල්ව කතා කිරීමේදී ඉස්ලාම් දහම පවසනා ආකාරයට සියදිවි නසා ගැනීම විශාලම පවකි. මෙම හේතුවෙන් ඉස්ලාමය අදහන බැතිමතුන් ඉතාම අවම ප්‍රමාණයෙන් දිවි තොර කර ගැනීම සඳහා පෙලබෙන බව දක්වා තිබේ. මුස්ලිම් වරුන් තමාගේ මරණයෙන් පසු ඇති මතු ජීවිතය ගැන අදහන අතර ඔවුන් දිවි තොර කර ගැනීමට පෙලඹෙන්නේ නම් ඔවුන්ට දවියන් වහන්සේ ගැන විශ්වාසයක් තිබිය නොහැකිය. එමෙන්ම දහම ගැන අවබෝධයක්ද නොමැති බව දක්වා තිබේ. සෞදි අරාබිය වැනි රටවල් දිවි නසා ගැනීමේ ලයිස්තුවේ ඉතා පහල අගයන් වාර්තා කරනු ලබන අතර දිවි නසා ගැනීමේ දර්ශකයේ 2012 වසරේදී සෞදි අරාබිය 171 වන ස්ථානයේ සිටීම දක්නට ලැබිණි. ශුද්ද වූ අල් කුරානය තුල දක්වා ඇති පරිදි

"දුප්පත්කමට බිය වී නුඹලාගේ දරුවන් ඝාතනය නොකරන්න. අපිම නුඹලාටද ඔවුන්ටද ආහාරය ලබා දෙමු. තවද නින්දාසහගත ක්‍රියාවන්හි ප්‍රසිද්ධ දේටද රහසිගත දේටද සමීප නොවන්න. අල්ලාහ් වැලක්වූ කුමන ජීවයක් වුවද අයිතියක් නොමැතිව ඝාතනය නොකරන්න."

මෙලෙස දක්වා ඇති අල්කුරානයේ වගන්ති හේතුවෙන් බොහෝවිට මුස්ලිම් ජාතිකයින් සිය දිවි නසා ගැනීම සඳහා යොමු වන්නේ නැත. නෝවා විද්‍යා පදනම දක්වන පරිදි ඔවුන් අතර සියදිවි නසා ගැනීම අවම වීමට මූලික හේතුව කුරානයේ බලපෑම් සහ මුස්ලිම්වරුන් අතර ඇති නරකාදිය පිලිබඳව වන දැඩි විශ්වාසයයි.

කිතුණුදහම ආශ්‍රයෙන් විග්‍රහ කිරීමේදී මුල්කාලීනව සිය දිවි නසා ගැනීම පවක් ලෙස සලකනු ලැබූ අතර එය දෙවියන්ට එරෙහිවූ ක්‍රියාවක් බව දේව අපහාසයක් ලෙස දක්වන ලදී. නමුත් වත්මන් සමාජය තුල කිතුණු සමාජය සහ පල්ලිය නව අදහස් මේ පිලිබඳව දක්වා තිබේ. පහළොස් වන සියවස තුල ශාන්ත ඔගස්ටින් විසින් ලියනු ලැබූ දෙවියන්ගේ නගරය නම් ග්‍රන්ථය තුල කිතු දහම තුල සියදිවි නසා ගැනීම සඳහා වන ප්‍රතිවිරෝධය දක්වා තිබුණි. හයවන සියවස පමණ වන විට සියදිවි නසා ගැනීම අපරාධයක් මෙන්ම පවක් ලෙස සැලකුණි. 1533 වැනි කාලවකවානුන් තුල ක්‍රිස්තියානි සමාජය විසි සිය ආගමානුකුල අවමංගල චාරිත්‍ර පවා ඉටු කිරීමෙන් වලකින ලෙස සමාජ සම්මතයන් සියදිවි නසා ගැනීමට එරෙහිව දැඩි කොට තිබිණි. 13 වන සියවසේදී තෝමස් ඇක්වයිනාස් විසින් සියදිවි නසා ගැනීම දෙවියන් වහන්සේට එරෙහි ක්‍රියාවක් ලෙසත් පසුතැවිලි වීමට නොහැකි පාපයක් ලෙසත් දක්වන ලද අතර සියදිවි නසා ගැනීම වැලැක්වීම සඳහා සිවිල් හා අපරාධ නීති පනවන ලදී. සාමාන්‍ය භූමදානයකට ඉඩදීම වැලක්වීමට පල්ලිය විසින් කටයුතු කල අතර සියදිවි නසා ගත් පුද්ගලයින්ගේ සහ පවුල් වල දේපල රාජසන්තක කිරීමට කටයුතු කරන ලදී. කතෝලික පල්ලිය විසින් වත්මනෙහිද දේවධර්මය ප්‍රකාරව සිය දිවි නසා ගැනීමෙන් වන මරණය බරපතල කාරණයක් ලෙස සලකනු ලබන අතර දෙවියන් වහන්සේගේ ත්‍යාගයක් වන ජීවිතය විනාශ කිරීම යනු ගැලවීම පිලිබඳව වන්නා වූ බලපොරොත්තු සුන් වීමක් ලෙස දක්වා තිබේ. නමුත් වත්මන් අදහස් ප්‍රකාරව ක්‍රිස්තුස් වහන්සේ මියගිය අයව සාධාරණය විනිශ්චය කරනු ලබන බවත් යුක්ති සහගතව විනිශ්චය කරනු ලබන බවත් සඳහන් වේ. බයිබලයේ සඳහන් පරිදි සියදිවි නසා ගැනීම පාපයකි.

සියදිවි නසා ගැනීම සම්බන්ධ නෛතික තත්වයන් පිලිබඳව කතිකා කිරීමේදී ආසියාතික, ඇමරිකානු සහ යුරෝපියානු

MANURAWA 2020

©All rights reserved
ISSN 1800-055X Vol. Iv

රාජ්‍යයන් මෙන්ම ඕස්ට්‍රේලියා මහාද්වීපය තුල ක්‍රියාත්මක වන නෛතික තත්වයන් විමසා බැලීම අවශ්‍ය වේ. බොහෝ රාජ්‍යයන් තම නෛතික පද්ධතිය ආගමික පසුබිමක් මත සැකසීමකට ලක් කර ඇති අවස්ථා මෙන්ම ඉන් පරිබාහිර අවස්ථා අපට මෙහිදී හඳුනා ගත හැකිය. ඉන්දියාව පිලිබඳව අවධානය යොමු කිරීමේදී ඉන්දියානු දණ්ඩනීති සංග්‍රහයේ 309 වන වගන්තිය වැදගත් වේ. සියදිවි නසා ගැනීමට උත්සහ කිරීම හා ඒ ආශ්‍රිතව සිදු කරනු ලබන ක්‍රියාකාරකම් සිරදඩුවම් ලැබීම , දඩ මුදලකක් නියම කිරීම මෙන්ම ඉහත දැක්වූ දණ්ඩන දෙකෙන්ම දඩුවම් කරනු ලැබිය හැකිය. නමුත් මෙම 309 දරන වගන්තිය සීමාකිරීමක් දක්නට ලැබෙන අතර 2017 ඉන්දියාව තුල පනවන ලද මානසික සෞඛ්‍ය ආරක්ෂණ පනත ප්‍රකාරව මෙම පනතේ අදාලත්වය සීමා කර ඇත. දණ්ඩනීති සංග්‍රහයේ 309 වන වගන්තිය නොතකා සියදිවි තොර කර ගන්නා හෝ ඒ සඳහා තැත් කරනා ඕනෑම පුද්ගලයෙක් වෙනත් අකාරයකට ඔප්පු නොකලහොත් දැඩි ආතතියකින් පෙලෙන බවට අනුමාන කල යුතු අතර එම සංග්‍රහය යටතේ නඩු විභාග කර දඩුවම් නියම කරනු නොලැබිය යුතුය, සියදිවි නසා ගැනීමට තැත් කිරීම අපරාධමය වරදක් වන බැවින් එය එසේ නොවන බවට තර්ක ගොඩනැගුවද ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව නීතියෙන් නියම කර ඇති කාර්යයපටිපාටියෙන් පරිබාහිරව කිසිම පුද්ගලයෙක් ඔහුගේ ජීවිතයෙන් හෝ පෞද්ගලික නිදහස අහිමි කිරීම නොකළ යුතුය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ජීවත්වීමේ අයිතිය හෝ නිදහස ආවරණය වන අතර ඒ සඳහා මැරීමේ අයිතිය ඇතුලත් නොවේ. මැක්‍රෝ ට්‍රෙන්ඩ්ස් වෙබ් අඩවිය ලෝක සෞඛ්‍ය සංවිධානය රැස්කල දත්ත අනුසාරිව දක්වන පරිදි 2018 වසර වන විට ඉන්දියාව තුල සියදිවි නසා ගැනීමේ අනුපාතය මිනිසුන් ලක්ෂයකට 16.3 ක අනුපාතයකි. තවද සියදිවි නසා ගැනීමේ දර්ශකයේ 21 වන ස්ථානය වන විට දිනාගෙන ඇත්තේ ඉන්දියාවයි. පාකිස්ථානය තුල පවතින සියදිවි නසා ගැනීම මූලික වශයෙන් මූලික සෞඛ්‍ය ගැටළුවක් ලෙස හඳුනා ගත හැකිය. වාර්තාවන් දක්වන ආකාරයට පකිස්ථානය තුල සියදිවි හානි කර ගැනීම සම්බන්ධයෙන් වන වාර්තාවන් සැකසීම සහ දත්තයන් රැස් කිරීම සමාජීය 2020 වශයෙන් පවතින යම් පසුගාමී අදහස් හේතුවෙන් ඉතා අසීරු කාර්යයකි. පාකිස්ථානය වැනි ඉස්ලාමීය රාජ්‍යයක් තුල ආගම විශාල කාර්යය භාරයක් ඉටු කරනු ලබයි. එබැවින් ඉස්ලාමීය ඉගැන්වීම් ප්‍රකාරව රට තුල සියදිවි නසා ගැනීම තහනම් ක්‍රියාවකි. නමුත් නිහඬ තවමත් පිළිතුරු සැපයීමට නොහැකි වූ ගැටළුවක් ලෙස පාකිස්ථානය තුල තවමත් සියදිවි නසා ගැනීමේ ගැටලුව ඉතිරිව පවතී. ලොව හයවන විශාලම ජනගහනයක් හිමි රාජ්‍ය වනුයේ පාකිස්තානය වන අතර එහි සමස්ත මුස්ලිම් ජනගහනයේ ප්‍රමාණය රටේ සම්පූර්ණ ජනගහනයෙන් 97 % ක ප්‍රමාණයකි. පාකිස්තානය තුල සියදිවි නසා ගැනීමට තැත් කිරීම සහ ඒ සඳහා අනුබල ලබාදීම අපරාධමය වරදක් ලෙස සැලකේ. ශුද්ධ වූ අල් කුරාණයෙහි 4:29 හි දක්වන පරිදි "හදම ියදමකා බදළු නසකක හදමරිැකෙ ඉැජ්මිැ ටදා යී ඉැබ පැරජසමෙක එද හදම." එබැවින් ඉහත සදහන් වූ පරිදි ඉස්ලාමීය රාජ්‍යයක් වීම නිසාවෙන්ම පාකිස්තානු නිතිය තුල සිය දිවි නසා ගැනීයමෙකු සියදිවි නසා ගැනීමට උත්සහ කිරීමට ඇත්තේ අපරාධමය ස්වභාවයකි. පකිස්තානු දණ්ඩනීති සංග්‍රහයේ 309 වගන්තිය ප්‍රකාරව සියදිවි නසා ගැනීමට උත්සහ ගැනීම වරදක් වන අතර ඒ සඳහා සිරදඩුවම්, දඩ මුදලක් හා ඉහත දඩ මුදලක් සහ සිරදඩුවම් යන ද්විත්වයෙන්ම දඩුවම් කල හැකි වරදකි. තවද එවැනි සිදුවීම් පොලිසිය වෙත වාර්තා කල යුතු අතර බොහෝවිට කලාතුරකින් මෙවැනි සිදුවීම් වාර්තා වන පසුබිමක් තුල පකිස්ථානය විසින් ඔවුන් මනෝවෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු කිරීම සිදු වේ.

එංගලන්තය තුල යෙමෙකු සියදිවි නසා ගැනීමට උත්සහ කිරීම අපරාධමය වරදක් ලෙස සැලකෙන්නේ නැත. 1961 වසරේ ඉදිරිපත් වූ සියදිවි හානිකර ගැනීමේ පනතේ 2 (1 ) වගන්තිය ප්‍රකාරව තවත් අයකුට සියදිවි නසා ගැනීමට උපකාර කිරීම අනුබල දීම උපදෙස් ලබා දීම හෝ එවන් අයකුට සිය දිවි නසා ගැනීමට උත්සහ කිරීමට උපකාර කිරීම වසර දහහතරක් නොඉක්මවන කාලයක් සඳහා සිරදඩුවම් නියම කිරීම යන වරදට වරදකරු කිරීම සඳහා හේතු වේ. තවද ඉතා දරුණු රෝගයකට ගොදුරුව සිටිමින් අදාළ

MANURAWA 2020

©All rights reserved
ISSN 1800-055X Vol. Iv

රෝගය උත්සන්න වුවහොත් සිය දිවි තොර කර ගැනීමට අදහස් කරගෙන සිටි පර්ඩි නම් කාන්තාවක් විසින් විදේශයකදී තමාගේ දිවිය තොර කර ගැනීමට උපකාර කරනු ලබන තම සැමියා සම්බන්දව තම රටේ නිතිය අදිකරණ සමාලෝචනයට ලක් කිරීම සඳහා නඩුකරයක් පනවන ලද අතර ඇයට තම සැමියාගේ කැමැත්ත නොමැතිව සහ සහාය නොමැතිව තම දිවි තොර කර ගැනීම කල නොහකි බව දක්වන ලදී වී චැරාහ ඩී ෘචච නඩු තීරණයෙන් එය ප්‍රශ්න කල අතර අවසන තීරණය වුයේ සියදිවි නසා ගැනීම සඳහා උපකාර මෙන්ම අනුබල ලබා දීම යන ක්‍රියාවන් අපරාධමය වරදක් වන බවයි. සහායක සියදිවි නසා ගැනීම සඳහා වන කතිකාවත ඉන් පසුව වඩා පුළුල් වූ අතර එහි ප්‍රතිපලයක් ලෙස වර්තමානයේ දිවි නසා ගනීම සඳහා වන සාපරාදී දණ්ඩන සහ සම්බාධක ඉවත් කර තිබේ. නමුත් රාජ්‍යයන් විසින් මුහුණ දෙන මුලික ගැටලුව වනුයේ සියදිවි නසා ගැනීම සඳහා උපකාර කිරීම සානුකම්පිතව කල යම් ආකාරයක වන ක්‍රියාවක්ද නැතහොත් ක්‍රෝධය පදනම් කරගනිමින් කල සාහසික ක්‍රියාවක්ද යන්න පැහැදිලිව බෙදා වෙන් කර හඳුනා ගැනීමේ ගැටලුවයි.

ශ්‍රීලංකාව තුල ඉතා ඉහල මට්ටමේ සියදිවි නසා ගැනීමේ අනුපාතයක් වාර්තා වන අතර 2020 වසර වන විට එක්සත් ජාතීන්ගේ ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් 2018 වසරේ නිකුත් කල දත්ත පදනම් කරගනිමින් ලබාගත් වාර්තාවන් ප්‍රකාරව ශ්‍රීලංකාව සිය දිවි නසා ගැනීමේ දර්ශකයේ 29 වන ස්ථානයේ රැදී සිටින අතර එහි අනුපාතය පුද්ගලයින් ලක්ෂයක් සඳහා 14.6 ක් වශයෙනි. ශ්‍රීලංකාව තුල බොහෝ සාධකයන් සියදිවි නසා ගැනීම සඳහා බලපෑම් කිරීම දක්නට ලැබේ. එනම් මත්ද්‍රව්‍ය භාවිතා කිරීම , අධ්‍යාපනය සම්බන්ධ ගැටළු, සමාජීය තරගය සහ මානසික පීඩනය මේ සඳහා හේතු වන බව දක්වා තිබේ. දණ්ඩනීති සංග්‍රහයේ 299 වන වගන්තිය ප්‍රකාරව යම් තැනැත්තෙකු සිය පන හානි කරගතහොත් එකී සිය පන හානි කරගැනීමට අනුබල දෙනු ලබන තැනැත්තෙකුට මරණ දඬුවමින් දඬුවම් කල යුතුය. එනම් සියදිවි නසා ගැනීමට අනුබල ලබා දීම ලාංකීය නිතිය තුල අපරාධමය වරදකි. තවද 302 වන වගන්තිය ප්‍රකාරව යම් තැනැත්තෙකු සිය පණ හානි කරගැනීමට තැත් කළහොත් හා ඒ සඳහා යම් ක්‍රියාවක් කරතොත් ඔහුට අවුරුද්දක් දක්වා කාලයක දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමක් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කල යුතුය. නමුත් 1998 අංක 29 දරණ දණ්ඩනීති සංග්‍රහ සංශෝධන පනත ප්‍රකාරව 302 වන වගන්තිය ඉවත් කරනු ලැබිණි. එබැවින් ශ්‍රීලංකාව තුල වර්තමානයේ සියදිවි නසා ගැනීමට තැත් කිරීම සඳහා දඬුවම් කිරීමක් සිදු නොවන අතර බොහෝවිට පොලිසිය හරහා මනෝවෛද්‍ය ප්‍රතිකාර හා මනෝ උපදේශන සේවාවන් වෙත යොමු කිරීම දක්නට ලැබේ.

ජීවිතය යනු දෙවියන් විසින් දුන් අපුර්වතම ත්‍යාගය හෝ මව පියා විසින් දුන් දිව්‍යමය වරම ලෙස ඔබටද මටද පසිදලන්නට පුළුවන. එය අවසන් කර නික්මීමට උත්සහ ගැනීම නිශ්පල දෙයක් මෙන්ම ජීවිතය යනු විදිය යුතුදෙයක් විනා විඳවිය යුතු දෙයක් නොවන බව පසක් කිරීමද එවන් පුද්ගලයින් වෙනුවෙන් නීතියේ සහය ගෙන යාමද ලබාදීමද ඔබගේම මගේද යුතුකම වන්නේය. එබැවින් ජීවිතයට ආදරය කිරීමට අප ලෝකය වෙත ඉගැන්විය යුතුය. දරුවාගේ සිට මහල්ලා දක්වා එම ජීවිතයේ හරය නම් බීජය වැපිරිය යුතුය. නුතන විද්‍යාත්මක, ආගමික සමාජයීය හෝ ආර්ථික හා සංස්කෘතිකමය හේතූන් විමර්ශනය කිරීමද එවන් ගැටළු අවම වන පරිදි දේශපාලන සහ පරිපාලනමය ප්‍රතිපත්ති හා තීරණ සකස් කිරීමද රටක් වශයෙන් කල හැකි ඉතා වටිනාම කාර්යයයි.

## ආශ්‍රිත ලේඛන


ඒකනායක, ක., 2020. *සියදිවි නසා ගැනීම පිලිබද සමාජ විද්‍යාත්මක හා අපරාධ විද්‍යාත්මක විග්‍රහයක් (තණමල්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරෙන්)*. [online]

Dr.lib.sjp.ac.lk. Available at: http://dr.lib.sjp.ac.lk/handle/123456789/5251

Snowdon, J., 2020. Indian Suicide Data: What Do They Mean?.



MANURAWA 2020


©All rights reserved

ISSN 1800-055X Vol. Iv

Vijaykumar, L., 2020. Suicide And Its Prevention: The Urgent Need In India.

World Health Organization. 2020. Suicide Across The World (2016). [online] Available at: <https://www.who.int/mental_health/prevention/suicide/suicideprevent/en/> [

(Vijaykumar, 2020)

Armstrong, M., 2020. Infographic: Suicide Rates Around The World. [online] Statista Infographics. Available at: <https://www.statista.com/chart/15390/global-suicide-rates/> [Accessed 2 May 2020].

Haque, A., 2020. Pakistan's Silent Suicide Problem. [online] DAWN.COM. Available at: <https://www.dawn.com/news/1494208>

Mental Health Foundation. 2020. Suicide. [online] Available at: https://www.mentalhealth.org.uk/a-to-z/s/suicide

Legislation.gov.uk. 2020. Suicide Act 1961. [online]

J, N., 2020. Suicide As A Crime In The UK: Legal History, International Comparisons And Present Implications. - Pubmed - NCBI. [online] Ncbi.nlm.nih.gov. Available at: https://www.ncbi.nlm.nih.gov/pubmed/8911560

DURKHEIM, E., 2018. ELEMENTARY FORMS OF THE RELIGIOUS LIFE. SIMON & BROWN.

Roar.media. 2020. [online] Available at: https://roar.media/sinhala/main/reports/the-disturbingly-high-trend-for-suicide/

Taylor & Francis. 2020. Suicide And Islam. [online] Available at: https://www.tandfonline.com/doi/abs/10.1080/13811110500318489?journalCode=usui20

1938. Sinhala Bible. Colombo: Ceylon Bible Soc.

1961. Al-Kurān [Qur'ān, Arab. U. Singhales.] Al-Quran.

Courses.lumenlearning.com. 2020. What Are The Types Of Suicide Given By Durkheim? | Introduction To Sociology. [online] Available at: https://courses.lumenlearning.com/atd-bmcc-sociology/chapter/what-are-the-types-of-suicide-given-by-durkheim/

Macrotrends.net. 2020. Sri Lanka Suicide Rate 2000-2020.

Retterstøl, N. and Ekeberg, Ø., 2020. Christianity And Suicide. [online] Oxford Medicine Online.

Theactionalliance.org. 2020. [online] Available at: <https://theactionalliance.org/sites/default/files/2018_buddhist_perspective_final.pdf>

MANURAWA 2020

©All rights reserved
ISSN 1800-055X Vol. Iv